## ඒ.ජී.එස්.ආර්. රාජපක්ෂ එ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 526 /2018 (2018.12.11 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඒ.ජී.එස්.ආර්. රාජපක්ෂ
**නොතිසි ලත් පාර්ශවය** - සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**පෙනීසිටීම**
අභියාචක - ඒ.ජී.එස්.ආර්. රාජපක්ෂ
පොදු අධිකාරිය - එස්. කරුණාරත්න, ජොෂ්ඨ සහකාර ලේකම්
එස්. වික්‍රමාරච්චි, ජොෂ්ඨ සහකාර ලේකම්
එස්.එස්.කේ. ගමගේ, සහකාර ලේකම්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.03.14 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.04.20 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.05.05 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.03.14 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

***1.*** *විශ්වවිද්‍යාලයක්/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක් / ආයතනයක් සතු බලතල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ බලතලවලට,කාර්යන්ට හා කර්තව්‍යන්ට යටත් වේද?*

2. මම කලින් දරන ලද ලිපිකරු තනතුරට පෙරදාතම හරවා යැවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය ලබාගෙන තිබේද ? එම ලේඛන වල සහතික ලද පිටපත්.
3. මම කලින් දරන ලද ලිපිකරු තනතුරට පෙරදාතම හරවා යැවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය ලබාගෙන නැද්ද? එසේනම් එම පාලක සභා තීරණයේ නීතිමය වලංගු බාවයක් නොතිබේද? එම තීරණය මැදිහත්වීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නීතිමය බලයක් තිබේද?
4. මම කලින් දරන ලද ලිපිකරු තනතුරට පෙරදාතම හරවා යැවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය ලබාදිය හැකිව තිබුනද?
5. **2010.07.13** දින සිට පේරාදෙණිය විශ්වවිද්‍යාලය මාගේ තනතරු නාමය ලෙස විවිධ තනතුරු නාමයන් භාවිතාකරමින් ලිපි ලේඛන නිකුත්කරමින් විවිධාකාර අඩත්තෙට්ටම් සහ බලහත්කාරකම් අද දින දක්වාම සිදුකරමින් මා හට බරපතල ලෙස තුවාල සිදු කරමින් පවතී. මාගේ තනතුරු නාමය එසේ වෙනස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය ලබාගත යුතුද?
6. මාගේ තනතුරු නාමය එසේ වෙනස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය ලබාගෙන තිබේද? එම ලිපි ලේඛන වල සහතික පිටපත ලබාදෙන්න.
7. මෙම කරුණය සම්බන්දයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අංක **UGC/HR/3/UPD** සහ **2017.05.19** දිනැති ලිපිය මගින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වාර්තාවක් කැඳවා ඇත. එම වාර්තාව ලැබීමෙන් පසු ඔබ හෝ අදාල නිලධාරීන් විසින් මෙම මාගේ කාරණය සම්බන්දයෙන් ලබාගෙන ඇති නිගමන මොනවද?මෙම සාපරාධී ක්‍රියාව සම්බන්දයෙන් නීතිමය පියවර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ හා අනෙකුත් රෙගුලාසි ප්‍රකාරව නීතිමය පියවර ගෙන තිබේද? මෙම කාරණය සම්බන්දයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව මෙම කාරණයට මැදිහත් වී එය නිරාකරණය කිරීමට හා වරදකරුවන් හට විරුද්ධව නීතිමය පියවර ගැනීමට ඇති බාධක සඳහන් කරන්න.
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිගමනය අනුව මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දරන ලද තනතුරු මොනවද?
9. එක් එක් තනතුරු වල මම සේවය කරන ලද වකවානු මොනවාද ?
10. මම සේවය හැරගොස් ඇත්තේ මම විසින් දරන ලද කුමන තනතුරේද?
11. මම ඒ තනතුර හැර ගියේ කවදා සිටද?
12. මම සේවයෙන් බලහත්කාරයෙන් සාපරාධී ලෙස ආරක්ෂක අංශයේද සහයෝගය ඇතිව ඉවත් කිරීමට ප්‍රථම විනය පරීක්ෂණයක් පවත්වා ඇත්ද?

13. *මාගේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සේවය අවසන් කල බවට ප්‍රථම වරට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් දැනුම් දී ඇති ලිපියේ පිටපතක්.*
14. *සාපරාධි වරදක් බැලූ බැල්මට පෙනිගියවිට ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වග උත්තරකරුවනට එරෙහිව අපරාධ නීතීය ක්‍රියාත්මක කිරීම සඳහා පොලිසියට සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට වහාම දැනුම් දී ඒ සඳහා අවශ්‍ය ඉදිරි නීතිමය පියවර ගැනීමට ඇති බාධකය කුමක්ද?*
15. *විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වාර්ෂිකව නිකුත්කරන මාගේ **2010** ට අදාල අර්ථසාධක අරමුදලේ ශේෂ ප්‍රකාශනය මේ දක්වා මා හට නිකුත් නොකර සිටින්නේ කුමන හේතුවක් නිසාද? එම ප්‍රකාශනය මා හට නිකුත් කරන මෙන් ඉල්ලා සිටිමි.*

පනතේ නියමිත කාල සීමාව අනුව තොරතුරු නිලධාරියා ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක 2018.04.20 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. නම්කළ නිලධාරියාද පනතේ නියමිත කාල සීමාව අනුව ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2018.05.05 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

2018.11.21 දිනැතිව පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට ගොනුකර ඇති ලිඛිත කරුණු දැක්වීම කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුවිය. එහි සඳහන් වන්නේ, අභියාචක විසින් 2018.02.28 දින පොදු අධිකාරියට යොමුකරන ලද ලිපියට පිළිතුරු ලෙස 2018.07.24 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධව අභියාචක වෙත කරුණු පැහැදිලි කර ඇති බවත් අභියාචක විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත යොමුකරන ලද 2018.03.28 දිනැති ලිපියෙන් අභියාචක විසින් තොරතුරු පනත යටතේ ගැටලු කීපයක් යොමුකර ඇති අතර එහිදී ඔහු පුහුණු කාර්මික නිලධාරී තනතුරේ සිට කලින් දරන ලද ලිපිකරු තනතුරට පෙරදාතම හරවා යැවීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන තිබේද යන්න පිළිබඳ විමසීමක් කර ඇත. එසේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ පස්වන පරිච්ඡේදයේ 3.2 වගන්ති කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුකරවන බවය. එනම්,

*"කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙන් කොමිෂන් සභාවෙ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ එයින් බැහර වූ වෙනත් තනතුරක් භාර ගැනීම සඳහා ස්ථිර ලෙස මුදාහැර ඇති තැනැත්තෙකුට තමන් කලින් දැරූ තනතුරට පෙරළා පත් කිරීමට අවසර දෙන්නේ නම්, එසේ කිරීමට*

*කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය වන අතර එය බඳවා ගැනීමේ පරිපාටියෙන් බාහිරව කරන ලද අලුත් පත්වීමක් ලෙස සලකනු ලැබේ."*

ඒ අනුව මෙම කාරණාව සම්බන්ධව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීතුමාගෙන් 2018.07.09 වන දින විමසීමක් කළ අතර 2018.08.20 වන දින ඒ සඳහා පිළිතුරු ලිපිය ලැබිණි. මේ සම්බන්ධව කොමිෂන් සභාවේ අවධානය යොමුකර ඇති අතර තීරණය ලද වහාම දැනුම් දෙන බවයි.

මීට අමතරව පොදු අධිකාරියේ කරුණු දැක්වීම මත පොදු අධිකාරිය විසින් අභියාචක වෙත අදාළ තොරතුරු මේ වනවිටත් ලබාදී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නියෝගය:**

ඒ අනුව අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු පොදු අධිකාරිය ලබාදී ඇති බැවින් අභියචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****